**කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව රාජ්‍ය අංශයේ ආයතනවල අගය වැඩි කිරීමට දායක වන්නේ කෙසේද ?**

**හැඳින්වීම**

රාජ්‍ය අංශයේ ආයතනවල වටිනාකම් නිර්මාණය කිරීමේදී කාර්ය සාධනය කෙරෙහි නැඹුරු වූ අඛණ්ඩ අභ්‍යන්තර විගණනය තුළින් සාම්ප්‍රදායිකව සිදු කරනු ලබන අනුකූලතා විගණනයට වඩා වැඩි ප්‍රතිලාභ ලබා ගත හැකිය. එය සංවිධානයේ ක්‍රියාකාරීත්වය නිසි ක්‍රමවේදයන් මගින් තක්සේරු කිරීම හා වැඩිදියුණු කිරීම මෙන්ම සඵලදායී අවදානම් කළමනාකරණයක් තුළින් ද ළඟා කර ගත හැකිය.

ඒ අනුව අභ්‍යන්තර විගණකවරයාගේ කාර්යභාරය ද වෙනස් විය යුතු අතර, වඩා හොඳ රාජ්‍ය සේවාවක් සැපයීමේදී ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීමට ඔහු විසින් උපදේශන කාර්යභාරය පිළිබඳව ද වැඩි අවධානයක් යොමු කිරීමට සූදානම් විය යුතුය.

රාජ්‍ය අංශයේ සංවිධාන, අපේක්ෂිත මට්ටමට ළඟා කර ගැනීම සඳහා ක්‍රියාකාරී සහාය ලබාදීමේ අරමුණින්, සෑම රාජ්‍ය ආයතනයක් පිළිබඳවම සමීප අධීක්ෂණයක් මහා භාණ්ඩාගාරය විසින් සිදු කරනු ලබයි.

**විගණන හා කළමනාකරණ කමිටු**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ අංක 38, 39 වගන්ති හා මුදල් රෙගුලාසි 127 ප්‍රකාරව සෑම අමාත්‍යාංශ ලේකම්වරයෙකුම ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා ලෙස තම අමාත්‍යාංශයේ සහ ඒ යටතේ ගැසට් කර ඇති දෙපාර්තමේන්තු හා අනෙකුත් ආයතනවල මූල්‍ය කළමනාකරණය පිළිබඳ වගකීමට යටත් වන අතර, තම අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන සම්බන්ධයෙන් රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව/ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව හමුවේ පෙනී සිටිය යුතු වේ. ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන්ට සිය රාජකාරි සඵලදායිව ඉටු කිරීමට සහය ලබා දීමේ අරමුණින් එම ආයතන තුළ කළමනාකරණ මෙවලමක් ලෙස භාවිත කිරීම සඳහා විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමට උපදෙස් ලබා දී ඇති අතර, කාර්තුවකට අවම වශයෙන් එක් රැස්වීමක් ලෙස වර්ෂයකට විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 4ක් පැවැත්විය යුතුය.

ජාතික විගණන පනතේ 41 වගන්තියේ සඳහන් ආකාරයට ශ්‍රී ලංකාව තුළ පවතින සම්පත්වලට ප්‍රමුඛතාවය ලබා දෙමින් සිදු කරනු ලබන ව්‍යාපෘතිය හෝ වැඩසටහන සම්බන්ධ කරුණු හෝ එම ආයතනවල පූර්ව නිශ්චිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා එහි සම්පත් ආර්ථිකමය හා කාර්යක්ෂමව භාවිත කරන බවට සහතික කිරීම සඳහා විගණිත ආයතනයේ සියලු විගණන හා කළමනාකරණ අංගයන් සම්බන්ධ කරුණු විගණන හා කළමනාකරණ කමිටු තුළ සමාලෝචනය කළ යුතුය.

ඒ අනුව රාජ්‍ය අංශයේ මූල්‍ය විනය සහතික කිරීම සඳහා සංවිධානයේ ක්‍රියාකාරීත්වය හා අභ්‍යන්තර පාලනය අධීක්ෂණය හා වැඩිදියුණු කිරීම, අවදානම් කළමනාකරණය මෙන්ම අභ්‍යන්තර විගණක හා විගණකාධිපති අතර මනා සන්නිවේදනයක් ඇති කිරීම, යනාදී වැදගත් කාර්යභාරයක් විගණන හා කළමනාකරණ කමිටු මගින් සිදු කරනු ලබයි. ඒ අතරම රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව සහ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව නිර්දේශයන් සමීපව අධීක්ෂණය කිරීමේ සාර්ථක ක්‍රමවේදයක් ලෙස විගණන හා කළමනාකරණ කමිටු හඳුනා ගෙන ඇත.

මහා භාණ්ඩාගාරය අදාළ ආයතන සමඟ සිදු කරනු ලබන සම්බන්ධීකරණය ශක්තිමත් කිරීමේ අරමුණින් උපදේශන සේවාවක් ඉටු කරනු ලබන්නා වූ සාමාජිකයෙකු ලෙස භාණ්ඩාගාර නියෝජිත විගණන හා කළමනාකරණ කමිටුවට සහභාගී වේ.

**හැකියා වර්ධනය**

අභ්‍යන්තර විගණනයේ වෙනස් වන පරිසරයට අනුගතවීමට අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය අත්‍යවශ්‍ය වේ. ඒ සඳහා දැනුම, කුසලතා, ආකල්ප හා නිපුණතා යාවත්කාලීනව සංවර්ධනය කළ යුතුය. රාජ්‍ය අංශයේ අභ්‍යන්තර විගණනයේ නියමු ආයතනය ලෙස මහා භාණ්ඩාගාරය මෙම කටයුත්තට අඛණ්ඩව සම්බන්ධ වේ.

**අභ්‍යන්තර විගණන ඒකක සමාලෝචනය**

රාජ්‍ය අංශයේ අභ්‍යන්තර විගණන ඒකක සමාලෝචනය කිරීමේ ක්‍රියාවලිය මගින් එක් එක් අභ්‍යන්තර විගණන ඒකක විසින් අනුගමනය කළ යුතු හොඳම භාවිතයන් හඳුන්වා දීමත්, රාජ්‍ය අංශයේ අභ්‍යන්තර විගණන කටයුතු ඒකීය මට්ටමකට ගෙන ඒම සඳහා අභ්‍යන්තර විගණකවරුන් සමඟ අත්දැකීම් හුවමාරු කර ගැනීමටත් අවස්ථාව ලබා දේ.

**පළාත් සභාවල අභ්‍යන්තර විගණනය**

සඵලදායී අභ්‍යන්තර විගණන ක්‍රියාවලියක් සහතික කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය යටතේ පළාත් සභා සඳහා පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තු සහ අභ්‍යන්තර විගණන ඒකක පිහිටුවා ඇත. මහා භාණ්ඩාගාරය වෙත ලබා දුන් රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාවේ නියෝගයකට අනුව ශක්තිමත් අභ්‍යන්තර විගණන පද්ධතියක් සහතික කිරීම සඳහා පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තු හා අභ්‍යන්තර විගණන ඒකකවල කාර්ය සාධනය වැඩි දියුණු කිරීමේ කාර්යභාරයට දායකවීමට මහා භාණ්ඩාගාරයට අවස්ථාව ලබා දී ඇත.

**රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව**

රාජ්‍ය අංශයේ සංවිධාන එනම් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, පළාත් සභා සහ පළාත් පාලන ආයතන රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත කැඳවා සමාලෝචනය කිරීමේදී එම ආයතනවල ක්‍රියාකාරකම්වලට අදාළ තොරතුරු ඇතුළත් වාර්තාවක් මහා භාණ්ඩාගාරය විසින් කාරක සභාව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

ඊට අමතරව, රාජ්‍ය අංශයේ කාර්යසාධනයට වටිනාකමක් එකතු කිරීම සඳහා අභ්‍යන්තර විගණනයට අදාළව විගණන හා කළමනාකරණ කමිටු විධිමත් කිරීම, විදේශ අරමුදල් ව්‍යාපෘතිවල අභ්‍යන්තර පාලන ක්‍රම ශක්තිමත් කිරීම හා අභ්‍යන්තර පාලන පද්ධති හඳුන්වාදීම වැනි කටයුතු සඳහා ක්‍රමවේද, මගපෙන්වීම් හා උපදෙස් හඳුන්වා දෙනු ඇත.